සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) විශ්වවිද්‍යාල හා කාර්මික විද්‍යාලවල පාඨමාලා හැදෑරීමට තෝරාගනු ලැබ ඇති දුප්පත් සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ජල හිඟයක් පවතින ප්‍රදේශවල ජල සැපයුම් යෝජනාක්‍රම ආරම්භ කිරීම;

(ඇ) සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ අදහස ඇතිව චාරිකා, විනෝද චාරිකා සහ වෙනත් කටයුතු සංවිධානය කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ සියළු ප්‍රජාවන් සහ ජනතාව අතර සාමය, හොඳහිත, අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම;

(ඉ) ස්වභාවික විපත් වැළැක්වීමට හා අවම කිරීමට පියවර ගැනීම;

(ඊ) පහත සඳහන් කාර්ය සඳහා අදාළ ආයතනවලට සහාය වීම—

(i) වැඩමුළු සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ විද්‍යුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ සේවාව ඇගයීමට සහ දිරිමත් කිරීමට මෙන්ම ඔවුන්ගේ වෘත්තීමය දැනුම වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය වෙනත් ආධාර සැපයීම;

(ii) ශික්ෂණ රෝහල්වලට අනුයුක්ත වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය සේවකයන්ගේ සහය ඇතිව අසරණ තැනැත්තන්ට වෛද්‍ය පහසුකම් ලබා දීම;

(iii) දුප්පත් දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය දිගටම පවත්වාගෙන යාම සඳහා මූල්‍ය අංශයෙන් හෝ වෙනත් අයුරින් සහය වීම;

